ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Press Notice No: HRC/P/i/S/19/08/25

# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා පොලීසිය සඳහා අවශ්‍ය සම්පත් සහ ආයතනික ප්‍රතිසංස්කරණ සම්බන්ධවයි

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පොලිස්පතිවරයා වෙත 2025.08.18 දිනතිව ලිපියක් යොමු කර ඇත. මෙම ලිපියේ මූලික අවධානය යොමු වී ඇත්තේ පොලිස් සේවය මානව හිමිකම් මූලධර්මයන්ට අනුකූලව කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සම්පත් වෙන් කිරීම සහ ආයතනික ප්‍රතිසංස්කරණය පිළිබඳ ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පොලිස් අත්අඩංගුවේ සිදුවන මරණ, වධහිංසා, මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ආරක්ෂාව, සහ සංක්‍රාන්තික සමාජභාවීය පුද්ගලයන්ගේ ආරක්ෂාව සැළැස්වීමේ අවශ්‍යතාව මත එම නව මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කළේය. කොමිෂන් සභාවේ මෙම මෑත කාලීන මාර්ගෝපදේශ සහ නිර්දේශ මත පදනම්ව පොලිස්පතිවරයා විසින් අභ්‍යන්තර චක්‍රලේඛ කිහිපයක් නිකුත් කිරීමට කටයුතු කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අගය කරනුලැබේ.

පොලිස් අධ්‍යාපන සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් මඟින් වෘත්තීය හැසිරීම, ප්‍රායෝගික අභියෝග පිළිබඳ අවබෝධය, සහ අභිප්‍රේරනය වැඩි වී තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ජාතික වධහිංසා වැළැක්වීමේ යාන්ත්‍රණය (NPM) මගින් දිස්ත්‍රික් මට්ටමින් පොලිස් ස්ථාන පරික්ෂා කර, පද්ධතිමය ගැටලු හඳුනා ගැනීමේ කටයුතුද සිදු කරයි.

මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා ඉදිරියේදී සම්බන්ධකර ගනිමින් ශ්‍රී ලංකා පොලිසියේ කටයුතුවලට සහාය ලබා දෙමින් සහ නීතියට අනුකූළව එකී රාජකාරි ඉටු කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

- පොලිස් ස්ථානවල යටිතල පහසුකම්, උපකරණ, සෞඛ්‍ය–ආරක්ෂක මට්ටම් හා CCTV පද්ධති වැඩිදියුණු කිරීම.
- කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම, කාන්තා හා දෙමළ/මුස්ලිම් නිලධාරීන් බඳවා ගැනීම, දෙමළ භාෂා දැනුම ඇති නිලධාරීන් වැඩි කිරීම.
- මූලික කුසලතා, නව විමර්ශන තාක්ෂණය, ප්‍රජා සහභාගීත්වය, සහ මානව හිමිකම් ප්‍රමිතීන් සම්බන්ධ පුහුණු වැඩසටහන් සංවිධානය.
- මීළඟ අයවැයෙන් පොලිසියට අතිරේක සම්පත් වෙන් කිරීම.

තවද, අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව ඉලක්ක ලෙස භාවිතා කිරීම නිලධාරීන් වෙත අසමතුලිත දිරිගැන්වීමක් බවට පත් වීමේ අවදානමක් සලකා බැලේ. ඒ වෙනුවට, කාර්ය සාධනය ඇගයීමේදී නඩු විසඳීමේ අනුපාතය, ප්‍රතිචාර කාලය, අත්අඩංගුව ගැනීම් හා දඬුවම් අනුපාතය, සහ අපරාධ අවම කිරීම වැනි ප්‍රමාණාත්මක මිනුම් භාවිතා කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව  නිර්දේශ කරයි.

.

නිහාල් චන්ද්‍රසිරි

මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ අංශය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

19.08.2025

දුරකථන අංකය : 011 2505595

විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com